ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2168/8 - 2020 මාර්තු මස 26 වැනි බ්‍රහස්පතින්දා - 2020.03.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

මුද්‍රාව

ගෝඨාභය රාජපක්ෂ.

### ජනාධිපති විධානය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන ව්‍යවස්ථාවෙන් අතිගරු ජනාධිපතිතුමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කොරෝනා වෛරසය ශ්‍රී ලංකාවෙන් තුරන් කිරීමේ දී වැඩි අවදානම් තත්ත්වයක් ඇති කොළඹ, කළුතර, ගම්පහ, පුත්තලම, යාපනය, මන්නාරම, කිලිනොච්චිය, වව්නියාව හා මුලතිව් දිස්ත්‍රික්කවලට ප්‍රමුඛත්වය දෙමින් එම ප්‍රදේශවලට ග්‍රාමීය ප්‍රදේශ හා නිෂ්පාදකයින් විසින් සපයනු ලබන ආහාර සැපයුම් ඍජුවම පාරිභෝගිකයින්ට ලබා දීම ඇතුළු සමස්ත ජන ජීවිතය යථා පරිදි පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන්නා වූ සේවාවන් අඛණ්ඩව සැපයීම මෙහෙයවීම, සම්බන්ධීකරණය හා පසු විපරම පිණිස ජනාධිපති කාර්ය සාධක බලකායක් ස්ථාපනය කිරීම.

1. බැසිල් රාජපක්ෂ මැතිතුමා
   ජනාධිපති විශේෂ නියෝජිත

2. රොෂාන් මහේෂ් ජේම්ස් ගුණතිලක මැතිතුමා
   ගරු ආණ්ඩුකාරවර, බස්නාහිර පළාත

3. ඒ.ජේ.එම්. මුසම්මිල් මැතිතුමා
   ගරු ආණ්ඩුකාරවර, වයඹ පළාත

4. පී.එස්.එම්. චාල්ස් මැතිතුමිය
   ගරු ආණ්ඩුකාරවර, උතුරු පළාත

5. ගාමිණී සේදර සෙනරත් මැතිතුමා
   අග්‍රාමාත්‍ය ලේකම්

6. එස්.ආර්. ආටිගල මැතිතුමා
   ලේකම්, මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය

7. වසන්තා පෙරේරා මැතිතුමිය
   ලේකම්, විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය

1A - G 32209 — 32 (2020/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

8. එස්. හෙට්ටිආරච්චි මැතිතුමා
ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

9. එච්.කේ.ඩී.ඩබ්ලිව්.එම්.එන්.බී. හපුහින්න මැතිතුමා
ලේකම්, මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය

10. ආචාර්ය ප්‍රියත් බන්දු වික්‍රම මැතිතුමා
ලේකම්, නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යාංශය

11. මේජර් ජනරාල් (විශ්‍රාමික) කමල් ගුණරත්න මැතිතුමා
ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය

12. ජී.කේ.එස්.එල්. රාජදාස මැතිතුමා
ලේකම්, අභ්‍යන්තර වෙළඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුබසාධන අමාත්‍යාංශය

13. ලුතිතන් ජනරාල් ශවේන්ද්‍ර සිල්වා මැතිතුමා
ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී / යුධ හමුදාපති

14. වයිස් අද්මිරාල් පියල් ද සිල්වා මැතිතුමා
නාවික හමුදාපති

15. ඩී.සී. වික්‍රමරත්න මැතිතුමා
වැඩ බලන පොලිස්පති

16. රියර් අද්මිරාල් (විශ්‍රාමික) ආනන්ද පීරිස් මැතිතුමා
අධ්‍යක්ෂ ජනරාල්, සිවිල් ආරක්ෂක බලකාය

17. ජේ.එම්.සී. ජයන්ති විජේතුංග මැතිතුමිය
ප්‍රධාන ලේකම්, බස්නාහිර පළාත

18. පී.බී.එම්. සිරිසේන මැතිතුමා
ප්‍රධාන ලේකම්, වයඹ පළාත

19. ඒ. පතිනාදන් මැතිතුමා
ප්‍රධාන ලේකම්, උතුරු පළාත

20. මේජර් ජනරාල් (විශ්‍රාමික) ශාන්ත දිසානායක මැතිතුමා
සභාපති, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

21. මහේෂ් ගම්මම්පිල මැතිතුමා
අධ්‍යක්ෂ, පොහොර ලේකම් කාර්යාලය

22. ජේ.ඒ. නුෂාඩ් එම්. පෙරේරා මැතිතුමා
සභාපති, සමූපකාර තොග වෙළඳ සංස්ථාව

23. බන්දුල තිලකසිරි මැතිතුමා
අධ්‍යක්ෂ ජනරාල්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

24. බොනිපස් සිල්වා මැතිතුමා
සාමාන්‍යාධිකාරී, මහජන බැංකුව

25. සුදත් ගුණසේකර මැතිතුමා
සාමාන්‍යාධිකාරී, ලංකා බැංකුව

26. ඉංජිනේරු විජිත හේරත් මැතිතුමා
සභාපති, ලංකා විදුලිබල මණ්ඩලය

27. ඩබ්ලිව්.ඩබ්ලිව්.ඩී. සුමිත් විජේසිංහ මැතිතුමා
සභාපති, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

28. ඒ. විමලවීර මැතිතුමා
කම්කරු කොමසාරිස් ජනරාල්

29. එස්. සිංගප්පුලි මැතිතුමා
සමූපකාර සංවර්ධන කොමසාරිස්

30. මේජර් ජනරාල් (විශ්‍රාමික) ජී. විජිත රවිප්‍රිය මැතිතුමා
අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා රේගුව

31. ප්‍රදීප් යසරත්න මැතිතුමා
දිස්ත්‍රික් ලේකම්, කොළඹ

32. සුනිල් ජයලත් මැතිතුමා
දිස්ත්‍රික් ලේකම්, ගම්පහ

33. කේ. මහේසන් මැතිතුමා
දිස්ත්‍රික් ලේකම්, යාපනය

34. යූ.ඩී.සී. ජයලාල් මැතිතුමා
දිස්ත්‍රික් ලේකම්, කළුතර

35. එල්.ජේ.එම්.ජී.සී. බණ්ඩාර මැතිතුමා
දිස්ත්‍රික් ලේකම්, පුත්තලම

36. එන්.ඩබ්ලිව්.ජී.ආර්.ඩී. නානායක්කාර මැතිතුමා
සහකාර මහ බැංකු අධිපති

37. ටී.එම්.ජේ.වයි.පී. ප්‍රනාන්දු මැතිතුමිය
සහකාර මහ බැංකු අධිපති

38. මේජර් ජනරාල් (විශ්‍රාමික) සුදන්ත රණසිංහ මැතිතුමා
අධ්‍යක්ෂ ජනරාල්, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

39. එස්.බී. දිවාරත්න මැතිතුමා
සම සභාපති, දරිද්‍රතාවය තුරන් කිරීම සහ ජීවනෝපාය සංවර්ධනය සඳහා කාර්ය සාධක බලකාය

40. මේජර් ජනරාල් (විශ්‍රාමික) සුමේධ පෙරේරා මැතිතුමා
සම සභාපති, දරිද්‍රතාවය තුරන් කිරීම සහ ජීවනෝපාය සංවර්ධනය සඳහා කාර්ය සාධක බලකාය

වෙත,

ශුභා ශිංසන පූර්වකවය!

ශ්‍රී ලංකාව තුළ මේ වන විට කොරෝනා රෝගීන් මෙන්ම ආසාදිත යැයි සැක කරනු ලබන පුද්ගලයින් සංඛ්‍යාව සෑම රටකම පාහේ වර්ධනය වෙමින් පවතින බව ලෝක සෞඛ්‍ය සංවිධානය මා වෙත සතිපතා පෙන්නුම් කර ඇති බැව් සැළකිල්ලට ගනිමින් ද,

ඉහත කී තත්ත්වය පාලනය කරමින් මෙය වසංගත තත්ත්වයක් දක්වා වර්ධනය වීම වළක්වාලමින් ශ්‍රී ලංකාවෙන් කොරෝනා රෝගය තුරන් කිරීම උදෙසා ගත යුතු සියලුම ක්‍රියා මාර්ගයන් ගැනීම රජයේ වගකීමක් වන හෙයින් ද,

උක්ත තත්ත්වයන් මැඩ පැවැත්වීම සඳහා සෞඛ්‍ය, ආරක්ෂක, ආහාර බෙදාහැරීම් ප්‍රමුඛ අනෙකුත් රාජ්‍ය හා පෞද්ගලික සියලුම අංශ ඒකාබද්ධව අවශ්‍ය මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම සඳහා රජය විසින් පියවර ගෙන ඇති බව අවධානයට ලක්කරමින් ද,

එසේම, තවදුරටත් සාමාන්‍ය ජන ජීවිතය යථා පරිදි පවත්වා ගැනීමට බාධාවක් නොවන සේ සියලු මහජන සේවාවන් අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා සියලුම රාජ්‍ය මෙන්ම පෞද්ගලික අංශයන් ද, රාජ්‍ය මැදිහත් වීම තුළ නිසි ක්‍රමවේදයන් යටතේ කළමනාකරණය කිරීමේ අවශ්‍යතාවය පැන නැගී ඇති හෙයින් ද,

විදේශ සැපයුම් ඇණහිටීමේ තත්ත්වයන් තුළ දේශීය ආහාර නිෂ්පාදනයේ අවශ්‍යතාව දැඩි ලෙස මතුවී ඇති බැවින් ද, ආහාර සුරක්ෂිතතාවය ඉතා ප්‍රමුඛ කාර්යයක් බැවින් ද,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති ධුරන්ධර ගෝඨාභය රාජපක්ෂ වන මම, ඔබතුමන්ලා ගේ විචක්ෂණභාවය, සාමාර්ථය සහ විශ්වාසවන්තභාවය කෙරෙහි මහත් වූ භක්තිය හා විශ්වාසය තබමින්, පූර්වෝක්ත ඔබතුමන්ලා, එනම්,

1. බැසිල් රාජපක්ෂ මැතිතුමා
   ජනාධිපති විශේෂ නියෝජිත

2. රොෂාන් මහේෂ් ජේම්ස් ගුණතිලක මැතිතුමා
   ගරු ආණ්ඩුකාරවර, බස්නාහිර පළාත

3. ඒ.ජේ.එම්. මුසම්මිල් මැතිතුමා
   ගරු ආණ්ඩුකාරවර, වයඹ පළාත

4. පී.එස්.එම්. චාල්ස් මැතිතුමිය
   ගරු ආණ්ඩුකාරවර, උතුරු පළාත

5. ගාමිණී සේදර සෙනරත් මැතිතුමා
   අග්‍රාමාත්‍ය ලේකම්

6. එස්.ආර්. ආටිගල මැතිතුමා
   ලේකම්, මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය

7. වසන්තා පෙරේරා මැතිතුමිය
   ලේකම්, විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය

8. එස්. හෙට්ටිආරච්චි මැතිතුමා
   ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

9. එච්.කේ.ඩී.ඩබ්ලිව්.එම්.එන්.බී. හපුහින්න මැතිතුමා
   ලේකම්, මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය

10. ආචාර්ය ප්‍රියත් බන්දු වික්‍රම මැතිතුමා
    ලේකම්, නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යාංශය

11. මේජර් ජනරාල් (විශ්‍රාමික) කමල් ගුණරත්න මැතිතුමා
    ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය

12. ජී.කේ.එස්.එල්. රාජදාස මැතිතුමා
    ලේකම්, අභ්‍යන්තර වෙළඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුබසාධන අමාත්‍යාංශය

13. ලුතිතන් ජනරාල් ශවේන්ද්‍ර සිල්වා මැතිතුමා
    ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී / යුධ හමුදාපති

14. වයිස් අද්මිරාල් පියල් ද සිල්වා මැතිතුමා
    නාවික හමුදාපති

15. ඩී.සී. වික්‍රමරත්න මැතිතුමා
වැඩ බලන පොලිස්පති

16. රියර් අද්මිරාල් (විශ්‍රාමික) ආනන්ද පීරිස් මැතිතුමා
අධ්‍යක්ෂ ජනරාල්, සිවිල් ආරක්ෂක බලකාය

17. ජේ.එම්.සී. ජයන්ති විජේතුංග මැතිතුමිය
ප්‍රධාන ලේකම්, බස්නාහිර පළාත

18. පී.බී.එම්. සිරිසේන මැතිතුමා
ප්‍රධාන ලේකම්, වයඹ පළාත

19. ඒ. පතිනාදන් මැතිතුමා
ප්‍රධාන ලේකම්, උතුරු පළාත

20. මේජර් ජනරාල් (විශ්‍රාමික) ශාන්ත දිසානායක මැතිතුමා
සභාපති, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

21. මහේෂ් ගම්මම්පිල මැතිතුමා
අධ්‍යක්ෂ, පොහොර ලේකම් කාර්යාලය

22. ජේ.ඒ. නුෂාඩ් එම්. පෙරේරා මැතිතුමා
සභාපති, සමූපකාර තොග වෙළඳ සංස්ථාව

23. බන්දුල තිලකසිරි මැතිතුමා
අධ්‍යක්ෂ ජනරාල්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

24. බොනිපස් සිල්වා මැතිතුමා
සාමාන්‍යාධිකාරී, මහජන බැංකුව

25. සුදත් ගුණසේකර මැතිතුමා
සාමාන්‍යාධිකාරී, ලංකා බැංකුව

26. ඉංජිනේරු විජිත හේරත් මැතිතුමා
සභාපති, ලංකා විදුලිබල මණ්ඩලය

27. ඩබ්ලිව්.ඩබ්ලිව්.ඩී. සුමිත් විජේසිංහ මැතිතුමා
සභාපති, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

28. ඒ. විමලවීර මැතිතුමා
කම්කරු කොමසාරිස් ජනරාල්

29. එස්. සිංගප්පුලි මැතිතුමා
සමූපකාර සංවර්ධන කොමසාරිස්

30. මේජර් ජනරාල් (විශ්‍රාමික) ජී. විජිත රවිප්‍රිය මැතිතුමා
අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා රේගුව

31. ප්‍රදීප් යසරත්න මැතිතුමා
දිස්ත්‍රික් ලේකම්, කොළඹ

32. සුනිල් ජයලත් මැතිතුමා
දිස්ත්‍රික් ලේකම්, ගම්පහ

33. කේ. මහේසන් මැතිතුමා
දිස්ත්‍රික් ලේකම්, යාපනය

34. යූ.ඩී.සී. ජයලාල් මැතිතුමා
දිස්ත්‍රික් ලේකම්, කළුතර

35. එල්.ජේ.එම්.ජී.සී. බණ්ඩාර මැතිතුමා
දිස්ත්‍රික් ලේකම්, පුත්තලම

36. එන්.ඩබ්ලිව්.ජී.ආර්.ඩී. නානායක්කාර මැතිතුමා
සහකාර මහ බැංකු අධිපති

37. ටී.එම්.ජේ.වයි.පී. ප්‍රනාන්දු මැතිතුමිය
සහකාර මහ බැංකු අධිපති

38. මේජර් ජනරාල් (විශ්‍රාමික) සුදන්ත රණසිංහ මැතිතුමා
අධ්‍යක්ෂ ජනරාල්, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

39. එස්.බී. දිවාරත්න මැතිතුමා
සම සභාපති, දරිද්‍රතාවය තුරන් කිරීම සහ ජීවනෝපාය සංවර්ධනය සඳහා කාර්ය සාධක බලකාය

40. මේජර් ජනරාල් (විශ්‍රාමික) සුමේධ පෙරේරා මැතිතුමා
සම සභාපති, දරිද්‍රතාවය තුරන් කිරීම සහ ජීවනෝපාය සංවර්ධනය සඳහා කාර්ය සාධක බලකාය

කොරෝනා වෛරසය ශ්‍රී ලංකාවෙන් තුරන් කිරීමේ දී වැඩි අවදානම් තත්ත්වයක් ඇති කොළඹ, කළුතර, ගම්පහ, පුත්තලම, යාපනය, මන්නාරම, කිලිනොච්චිය, වව්නියාව හා මුලතිව් දිස්ත්‍රික්කවලට ප්‍රමුඛත්වය දෙමින් එම ප්‍රදේශවලට ග්‍රාමීය ප්‍රදේශ හා නිෂ්පාදකයින් විසින් සපයනු ලබන ආහාර සැපයුම් සෘජුවම පාරිභෝගිකයින්ට ලබා දීම ඇතුළු සමස්ත ජන ජීවිතය යථා පරිදි පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන්නා වූ සේවාවන් අඛණ්ඩව සැපයීම මෙහෙයවීම, සම්බන්ධීකරණය හා පසු විපරම පිණිස වූ ජනාධිපති කාර්ය සාධක බලකායෙහි සාමාජිකයින් ලෙස මතු දැක්වෙන කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා මෙයින් පත් කරමි.

1. වී, ධාන්‍ය, එළවළු, පළතුරු, මාළු, මස්, කිරි හා බිත්තර නිෂ්පාදන ගොවිපල කටයුතු හා තේ, කුරුඳු, ගම්මිරිස් ආදී වැවිලි නිෂ්පාදන කටයුතු සඳහා ගොවීන්ට අවශ්‍ය පහසුකම් සැපයීම.

2. කෘෂිකාර්මික නිෂ්පාදන හා අනෙකුත් අත්‍යවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය පාරිභෝගිකයන්ට සෘජුව ලබා දීම සඳහා සියලු ආර්ථික මධ්‍යස්ථාන, ලංකා සතොස, සමුපකාර වෙළඳ ජාලය, කාගිල්ස්, කීල්ස්, ආර්පිකෝ, ලාෆ් වෙළඳ ජාලය සංවිධානය කිරීම හා මෙහෙයවීම.

3. ආර්ථික මධ්‍යස්ථානවලට ලැබෙන ගොවි නිෂ්පාදන එම ප්‍රදේශවල පාරිභෝගිකයින්ට මෙන්ම නාගරික ප්‍රදේශවල පාරිභෝගිකයින්ට ගෘහ මට්ටමෙන් ලබා දීම සඳහා බෙදා හැරීමේ වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීම.

4. අත්‍යවශ්‍ය වියළි ආහාර, ඖෂධ ආනයනය මෙන්ම අපනයනය කරනු ලබන තේ, සනීපාරක්ෂක ඇඳුම් වැනි අපනයනයන් පහසු කිරීම සඳහා ශ්‍රී ලංකා වරාය, ශ්‍රී ලංකා රේගුව, ආයතනික බැංකු කටයුතු සහ අනෙකුත් රාජ්‍ය නියාමන ආයතන සම්බන්ධීකරණය හා අවශ්‍ය තීරණ ක්‍රියාත්මක කිරීම.

5. සහල්, පොල්, තේ, සත්ත්ව ආහාර, දේශීයව නිපදවන සනීපාරක්ෂක භාණ්ඩ හා ආහාර ප්‍රවාහනය සඳහා අවශ්‍ය ඉන්ධන, ආරක්ෂක සේවා, බැංකු පහසුකම් ලබා දීම.

6. අත්‍යවශ්‍ය සේවා, භාණ්ඩ හා සේවා පාරිභෝගිකයින්ට ලබා දෙන ලොරි, ත්‍රී වීලර්, බස් රථ, මෝටර් සයිකල් වල යෙදෙන රියදුරන් හා සහායකයින් ගේ සෞඛ්‍ය හා සනීපාරක්ෂක කටයුතු සඳහා පහසුකම් සැලසීම හා අවශ්‍ය ඉන්ධන ලබා ගැනීමට පොලිස් ඇඳිරි නීතිය පැවැත්වෙන කාලය තුළ ලංකා ඛනිජ තෙල් සංස්ථාවේ තෝරාගත් ඉන්ධන පිරවුම්හල් විවෘතව තැබීම හා අවශ්‍ය ඉන්ධන ලබා දීම.

7. ගොවිතැන් කටයුතු සඳහා අවශ්‍ය බීජ, පැලෑටි, පොහොර, උපකරණ ලබා දීමට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව, සමෘද්ධි අධිකාරිය, සමුපකාර ගොවි සමිති, ගොවි සංවිධාන, පෞද්ගලික බීජ නිෂ්පාදන ආයතන මෙහෙය වීම හා අවශ්‍ය පහසුකම් සැපයීම.

8. බීජ ගොවිපලවල් දිරිගැන්වීම, කාබනික පොහොර භාවිතය ප්‍රචලිත කිරීම හා ගෘහ වගා නිෂ්පාදන දිරිගැන්වීම, හැකිතාක් ස්වයං පරිභෝජන සැපයුමක් ගෙවතු වගාවන් ප්‍රචලිත කිරීමට ග්‍රාමීය ව්‍යාප්ත සේවාවල නිරත වන නිලධාරීන් මෙහෙය වීම.

9. ලංකා බැංකු, මහජන බැංකු, ප්‍රාදේශීය සංවර්ධන බැංකු, සමෘද්ධි බැංකු ශාඛා මගින් ගොවීන් සඳහා අවශ්‍ය ණය මුදල් ලබා දීමට අවශ්‍ය පියවර ගැනීම හා මෙහෙය වීම.

10. ග්‍රාමීය හා නාගරික ප්‍රදේශවල කසල බැහැර කිරීම්, විදුලිය හා ජල සැපයුම් සේවා අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා සුදුසු වැඩපිළිවෙලවල් ක්‍රියාත්මක කිරීම.

11. උක්ත පහසුකම් සැපයීමේ දී, කාන්තාවන්, අඩු ආදායම්ලාභී පවුල් හා ඍජුවම අවදානමට ලක්වූ පුද්ගලයින් සඳහා විශේෂ අවධානය යොමු කිරීමට අවශ්‍ය පියවර ගැනීම.

12. සෑම බැංකු ශාඛාවක්ම ගනුදෙනු කරුවන් ගේ අවශ්‍යතා ඉටු කිරීමට හැකිවන අත්‍යවශ්‍ය බැංකු සේවාවන් ඉටු කිරීමට දිනකට අවම වශයෙන් පැය 04කට අවම සේවක සංඛ්‍යාවක් යොදා විවෘතව තැබීම.

තවද, ජනාධිපති විශේෂ නියෝජිත, බැසිල් රාජපක්ෂ මැතිතුමා කාර්යසාධක බලකායේ සභාපති ලෙසත්,

අග්‍රාමාත්‍ය කාර්යාලයේ අතිරේක ලේකම් ඇන්ටන් පෙරේරා මැතිතුමා කාර්යසාධක බලකායේ ලේකම් ලෙසත් පත් කරමි.

තවද, මෙයින් පවරනු ලබන කර්තව්‍යයන් ඉටුකරලීමට අදාළව අවශ්‍ය විය හැකි පරිදි කරුණු සොයා බැලීමට සහ උපදෙස් නිකුත් කිරීමට කොරෝනා වෛරසය ශ්‍රී ලංකාවෙන් තුරන් කිරීමේ දී වැඩි අවදානම් තත්ත්වයක් ඇති කොළඹ, කළුතර, ගම්පහ, පුත්තලම, යාපනය, මන්නාරම, කිලිනොච්චිය, වව්නියාව හා මුලතිව් දිස්ත්‍රික්කවලට ප්‍රමුඛත්වය දෙමින් එම ප්‍රදේශවලට ග්‍රාමීය ප්‍රදේශ හා නිෂ්පාදකයින් විසින් සපයනු ලබන ආහාර සැපයුම් ඍජුවම පාරිභෝගිකයින්ට ලබා දීම ඇතුළු සමස්ත ජන ජීවිතය යථා පරිදි පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන්නා වූ සේවාවන් අඛණ්ඩව සැපයීම මෙහෙයවීම, සම්බන්ධීකරණය හා පසු විපරම පිණිස වූ කාර්ය සාධක බලකාය වෙත මම මෙයින් බලය පවරමි.

තවද, කොරෝනා වෛරසය ශ්‍රී ලංකාවෙන් තුරන් කිරීමේ දී වැඩි අවදානම් තත්ත්වයක් ඇති කොළඹ, කළුතර, ගම්පහ, පුත්තලම, යාපනය, මන්නාරම, කිලිනොච්චිය, වව්නියාව හා මුලතිව් දිස්ත්‍රික්කවලට ප්‍රමුඛත්වය දෙමින් එම ප්‍රදේශවලට ග්‍රාමීය ප්‍රදේශ හා නිෂ්පාදකයින් විසින් සපයනු ලබන ආහාර සැපයුම් ඍජුවම පාරිභෝගිකයින්ට ලබා දීම ඇතුළු සමස්ත ජන ජීවිතය යථා පරිදි පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන්නා වූ සේවාවන් අඛණ්ඩව සැපයීම මෙහෙයවීම, සම්බන්ධීකරණය හා පසු විපරම පිණිස වූ කාර්ය සාධක බලකායේ සාමාජිකයින් වන ඔබට කලින් කලට මා හට වාර්තා ඉදිරිපත් කිරීමට මෙයින් බලය පවරමි.

තවද, කොරෝනා වෛරසය ශ්‍රී ලංකාවෙන් තුරන් කිරීමේ දී වැඩි අවදානම් තත්ත්වයක් ඇති කොළඹ, කළුතර, ගම්පහ, පුත්තලම, යාපනය, මන්නාරම, කිලිනොච්චිය, වව්නියාව හා මුලතිව් දිස්ත්‍රික්කවලට ප්‍රමුඛත්වය දෙමින් එම ප්‍රදේශවලට ග්‍රාමීය ප්‍රදේශ හා නිෂ්පාදකයින් විසින් සපයනු ලබන ආහාර සැපයුම් ඍජුවම පාරිභෝගිකයින්ට ලබා දීම ඇතුළු සමස්ත ජන ජීවිතය යථා පරිදි පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන්නා වූ සේවාවන් අඛණ්ඩව සැපයීම මෙහෙයවීම, සම්බන්ධීකරණය හා පසු විපරම පිණිස වූ කාර්ය සාධක බලකාය විසින් උපදෙස් නිකුත් කරනු ලැබිය හැකි නැතහොත් සේවා සැපයීම පිණිස සහාය ඉල්ලා සිටිය හැකි සියලුම රජයේ නිලධරයන් හා එබඳු සෙසු තැනැත්තන් විසින් තත් කාර්යය සම්බන්ධයෙන් නිසි අයුරින් පිළිපැදිය හැකි එබඳු උපදෙස්වලට අනුකූලව ක්‍රියාකළ යුතු යැයිද, ලබාදිය හැකි සියලුම සහාය සැලසිය යුතු යැයිද, සැපයිය හැකි සියලුම තොරතුරු ලබාදිය යුතු යැයිද මම මෙයින් සියලුම රජයේ නිලධරයන්ට සහ සෙසු තැනැත්තන්ට නියම කොට විධානය කරමි.

තවද, කිසියම් රාජ්‍ය සේවකයෙකු හෝ කිසියම් අමාත්‍යාංශයක, රජයේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක හෝ වෙනත් එබඳු ආයතනයක නිලධාරියෙකු විසින් පෙරකී කාර්යසාධක බලකාය විසින් පවරන ලද රාජකාරි හා වගකීම් ඉටු කිරීම ප්‍රමාද කරන හෝ පැහැර හරින සියලු අවස්ථා මා හට වාර්තා කරන ලෙස පෙරකී කාර්යසාධක බලකායට මම මෙයින් නියමකොට විධාන කරමි.

වර්ෂ දෙදහස් විස්සක් වූ මාර්තු මස 23 වන දින වූ මෙදින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ කොළඹ දී දෙන ලදි.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

**පී.බී. ජයසුන්දර,**
ජනාධිපති ලේකම්.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.